

## ලේකම්තුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකාව තුළ සමාජ ආරක්ෂක වැඩසටහන් රාශියක් ක්‍රියාත්මකවෙයි. ඒවා සමාජ සේවා, සෞඛ්‍ය හා පෝෂණ, අධ්‍යාපන, කෘෂිකර්ම යන ක්ෂේත්‍රයන් ඔස්සේ පෙළගැසී තිබේ. මෙම සෑම යෝජනා ක්‍රමයකම පරමාර්ථය වන්නේ අඩු ආදායම්ලාභී පවුල්වලට වඩා හොඳ ජීවන තත්වයක් සහතික කිරීමයි. මෙම සියළු සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමයන් වෙනුවෙන් රජය වසරකට රුපියල් බිලියන 200කට පමණ ප්‍රමාණයක් වැය කරයි.

සමෘද්ධි සහනාධාරය, වැඩිහිටි තැනැත්තන් සඳහාවූ දීමනාව, හඳුනා නොගත් හේතූන් මත වූ වකුගඩු රෝගීන් සඳහා දීමනාව, මහජනාධාර හා ආබාධිත තැනැත්තන් සදහා වූ දීමනාව යන යෝජනා ක්‍රමයන්, මුල් අදියරේදී 2002 අංක 24 දරණ පනත යටතේ පිහිටුවා ඇති සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය යටතේ ක්‍රියත්මක කරනු වස් සුදුසුකම් සහිත තැනැත්තන් නැවත හඳුනා ගැනීම සඳහා මේ වන විට අයදුම්පත් කැඳවා තිබේ. දිවයිනේ සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව සේවය කරන නිලධාරින්ගේ පෞද්ගලික ජංගම දුරකථනය පාවිච්චි කරමින් දත්ත රැස් කිරීමට සුදානම්වී තිබීම පෙර නොවූ විරූ තත්වයක් මෙන්ම ප්‍රශංසාවට පාත්‍ර වියයුතු කරුණකි.

අපේ රට ආර්ථික වශයෙන් අසීරුතාවයන්ට මුහුණ දී ඇති මේ අවස්ථාවේ අඩු ආදායම්ලාභී පවුල් කේන්ද්‍ර කොට ගනිමින් ප්‍රතිලාභ සැලසීමට ගනු ලබන මේ ප්‍රයත්නය සර්වප්‍රකාරයෙන් සාර්ථක වේවායි ඉත සිතින් මම ප්‍රාර්ථනා කරමි.

මහින්ද සිරිවර්දන

ලේකම්

මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය